# අ.පො.ස. (උ.පෙළ) විභාගය - 2020

## 47 - ඉස්ලාම් ශිෂ්ඨාචාරය (නව නිර්දේශය)

## ලකුණු බෙදීයාම

| | | | |
|---|---|---|---|
| I පත්‍රය | 02 X 50 | = | 100 |
| II පත්‍රය | 02 X 50 | = | 100 |
| එකතුව | | = | 200 |

Department of Examinations

# උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

1. උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. සෑම උත්තරපත්‍රයකම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේදී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
3. ඉලක්කම් ලිවීමේදී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.
4. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ..................................................
..................................................
.................................................. √ △ 4

(ii) ..................................................
..................................................
.................................................. √ △ 3

(iii) ..................................................
..................................................
.................................................. √ △ 3

(03) (i) 4 + (ii) 3 + (iii) 3 = 10/□

Department of Examinations

**බහුවරණ උත්තරපත්‍ර : (කවුළු පත්‍රය)**

1. අ.පො.ස. (උ.පෙළ) හා තොරතුරු තාක්ෂණ විභාගය සඳහා කවුළු පත්‍ර දෙපාර්තමේන්තුව මගින් සකසනු ලැබේ. නිවැරදි වරණ කපා ඉවත් කළ සහතික කරන ලද කවුළුපතක් ඔබ වෙත සපයනු ලැබේ. සහතික කළ කවුළු පත්‍රයක් භාවිත කිරීම පරීක්ෂකගේ වගකීම වේ.
2. අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.
3. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර 0 ලකුණකින් ද වරණ මත ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.
2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.
3. සෑම ප්‍රශ්නයකටම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.
4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම

ලකුණු ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ. එබැවින් එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතු ය. I පත්‍රය සඳහා බහුවරණ පිළිතුරු පත්‍රයක් පමණක් ඇති විට ලකුණු ලැයිස්තුවට ලකුණු ඇතුළත් කිරීමෙන් පසු අකුරෙන් ලියන්න. අනෙකුත් උත්තරපත්‍ර සඳහා විස්තර ලකුණු ඇතුළත් කරන්න. 51 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර අකුරෙන් ද ලිවිය යුතු වේ.

Department of Examinations

***

## පරීක්ෂකවරුන් සඳහා පොදු උපදෙස්

01.

I. ඔබ භාරගෙන ඇති මෙම රාජකාරිය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අනාගතය තීරණය කරන කාර්යක් බැවින් ඉතා වගකීමෙන් ඉටු කළ යුත්තකි.

II. මෙම කාර්යයේදී ඔබ ඉතා අවංකව කටයුතු කළ යුතුයැයි විභාග දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ.

### 02. ලකුණු ලබා දීමේ පරිපාටිය

ලකුණු ලබා දීමේ පරිපාටිය පරීක්ෂකවරුන් අතර සංගතතාවයන් ඇති කරන බැවින්, ශිෂ්‍ය ශිෂ්‍යාවන් සාධාරණව ඇගයීමට ලක්කිරීමට, ලකුණු ලබා දීමේ පරිපාටිය සම්පූර්ණයෙන් පිළිපැදීම අත්‍යවශ්‍ය වේ.

Department of Examinations

### 03. උපදෙස්

විභාග දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර ඇති සියලුම උපදෙස් පරීක්ෂකවරුන් විසින් සම්පූර්ණයෙන්ම පිළිපැදීම අත්‍යවශ්‍ය වේ.

### 04. උත්තර පත්‍ර ඇගයීම

උත්තර පත්‍ර ඇගයීමේ කාර්ය ආරම්භ කිරීමට ප්‍රථම එක් එක් ප්‍රශ්නය සඳහා ශිෂ්‍යන්ගෙන් බලාපොරොත්තු වන උත්තරය කුමක් දැයි ලකුණු ලබාදීමේ පටිපාටිය හොඳින් කියවා පැහැදිලි කරගත යුතුයි. අමතර පැහැදිලි කිරීම් අවශ්‍යවුවහොත් ප්‍රධාන පාලක පරීක්ෂක/ ප්‍රධාන පරීක්ෂකගේ උපදෙස් ලබාගත හැක.

### 05. ලකුණු ලබාදීමේ පිළිවෙල

01 වන පත්‍රය

මෙම පත්‍රයේ ප්‍රශ්න 50ක් ඇත. එක් ප්‍රශ්නයකට ලකුණු 02ක් බැගින් ලකුණු 100 ක් හිමි වේ.

02 වන පත්‍රය

මෙම පත්‍රයේ I කොටස, II කොටස යනුවෙන් කොටස් දෙකක් ඇත. I කොටසේ උප කොටස් පහකින් යුතු ප්‍රශ්න තුනක් ඇතුලත්ය. II කොටසේ උප කොටස් දෙකකින් යුතු ප්‍රශ්න පහක් ඇතුලත්ය. අයදුම්කරුවන් I කොටසේ ප්‍රශ්න දෙකකටත් II කොටසේ ප්‍රශ්න තුනකටත් උත්තර සැපයිය යුතුය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් හිමි වේ.

**ලකුණු ලබාදීමේ පිළිවෙත**

| | | | |
|---|---|---|---|
| **I පත්‍රය** | 50 × 2 | = | 100 |

ප්‍රශ්න 50යි.
ලකුණු 02 බැගින්

**II පත්‍රය**

| | | | |
|---|---|---|---|
| I කොටස ප්‍රශ්න 02 ක් | 2 × 20 | = | 40 |
| II කොටස ප්‍රශ්න 03 ක් | 3 × 20 | = | 60 |

Department of Examinations

0116

AL/2020/47-S-I(NEW)

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

ඉස්ලාම් ශිෂ්ටාචාරය I
இஸ்லாமிய நாகரிகம் I
Islamic Civilization I

47 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

※ **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
※ උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
※ උත්තර පත්‍රයේ පසුපිටේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
※ **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට දී ඇති (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) **යොදා දක්වන්න.**

**1.** ජාහිලියියා සමයේ කඃබාවෙහි පරිපාලනය හැඳින්වූ නම කුමක් ද?
(1) සිකායා (2) ලිවා (3) හිජාබා (4) රිෆාදා (5) නද්වා

**2.** අබූ උස්මාන්ගේ නායකත්වයෙන් යුත් වෙළෙඳ දූත කණ්ඩායම ඊජිප්තුවට පිටත්කරන ලද්දේ ශ්‍රී ලංකාවේ කුමන රාජ්‍ය සමයේ දී ද?
(1) ගම්පොළ (2) යාපහුව (3) අනුරාධපුර
(4) පොළොන්නරුව (5) මහනුවර

**3.** ඉස්ලාම්, මිනිසා මත පටවා ඇති වගකීම් පෙන්වන කාණ්ඩය කුමක් ද?
(1) ඉබාදත්, හික්මත්, නුස්රත් වේ. (2) ඉබාදත්, ඉමාරත්, කිලාෆත් වේ.
(3) රිසාලත්, ඉස්මත්, වකාලත් වේ. (4) තෞහීද්, රිසාලත්, මආද් වේ.
(5) ඉමාරත්, ඉජාරත්, සිකායත් වේ.

**4.** ඉමාම් අහ්මද් ඉබ්නු හම්බල් (රහ්) තුමාගේ ජනප්‍රිය වූ ෆික්හු ග්‍රන්ථය කුමක් ද?
(1) මසාඉල් සාලිහ් (2) කිතාබුර් රිසාලා (3) මුකද්දිමා
(4) පුතුහුල් කෙබ් (5) ෆික්හුල් කබීර්

**5.** ශ්‍රී ලංකාවේ වැලිගම පිහිටි 'මද්රසතුල් බාරි' හි නිර්මාතෘ කවුද?
(1) මුබාරක් මව්ලානා වේ. (2) ෂෙයිහ් මුස්තෆා වලියුල්ලා වේ.
(3) මාප්පිලෙයි ලෙබ්බෙ ආලිම් වේ. (4) අල්-බාදිබ් අල්-යමානි වේ.
(5) කසාවත්තේ ආලිම් සාහිබ් වේ.

**6.** හුදෛබියා සම්මුතියේ සටහන් වූ අවස්ථාවේ මක්කා සිට මදීනාවට පැමිණි සහාබිවරයෙක් කුරෛෂ්වරුන් විසින් නැවතත් මක්කාවට කැටුව ගියේ ය. එම සහාබිවරයා වන්නේ,
(1) අබූ ජන්දල් (රලි) වේ. (2) අබූ සර්ද් අල් කුද්රි (රලි) වේ.
(3) අබ්දුර් රහ්මාන් බින් අව්ෆ් (රලි) වේ. (4) සඃද් බින් අබී වක්කාස් (රලි) වේ.
(5) මආද් බින් ජබල් (රලි) වේ.

**7.** පහත ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) ඉමාම් මාලික් (රහ්) තුමා තෆ්සීර් දේශකයන් අතුරෙන් කෙනෙකි.
(2) දීනේ ඉලාහි යන චින්තනය මෝගල් රජු බාබර් ඉදිරිපත් කර ඇත.
(3) වෛද්‍ය විද්‍යාඥ ඉබ්නු නෆීස් රුධිර සංසරණය පිළිබඳ අදහස් ප්‍රකාශ කර ඇත.
(4) අකබා සම්මුතිය නබිතුමා සහ මක්කා වැසියන් අතර සිදු වූවකි.
(5) ඉස්ලාම් ශිෂ්ටාචාරය අරාබි සංස්කෘතිය පදනම් වූවකි.

Department of Examinations

Department of Examinations

**8.** පහත දැක්වෙන හදීස් අතුරෙන් ප්‍රබලව පවතින හදීස් වන්නේ,
(1) හදීස් මෂ්හූර් ය. (2) හදීස් මුතවාතිර් ය. (3) හදීස් මර්ෆූඋ ය.
(4) හදීස් සහීහ් ය. (5) හදීස් මුර්සල් ය.

**9.** මුස්තෆා කමාල් විසින් පාලනයෙන් නෙරපා හරින ලද අවසාන උස්මානීය සුල්තාන් වන්නේ,
(1) සුල්තාන් මුරාද් වේ. (2) සුල්තාන් සලාහුදීන් වේ.
(3) සුල්තාන් සලීම් වේ. (4) සුල්තාන් අබ්දුල් හමීද් වේ.
(5) සුල්තාන් මුහම්මදු අල්-ෆාතිහ් වේ.

**10.** සාහිබුස්සිර් යනුවෙන් හැඳින් වූ නබිතුමාගේ මිතුරා කවුද?
(1) අලි (රලි) (2) හුදෛබතුල් යමානි (රලි) (3) මුආවියා (රලි)
(4) හසන් (රලි) (5) අබූ මූසා අල්-අෂ්අරි (රලි)

**11.** පහත සඳහන් අය අතුරෙන් අල්-කුර්ආනයට අර්ථ දැක්වීම් රචනා කළ දෙදෙනෙකු දැක්වෙන වරණය තෝරන්න.
(1) ෆහ්රුද්දීන් අර්රාසි (රහ්) - ෆුලෛල් බින් ඉයාල් (රහ්)
(2) ඉමාම් ෂාහ් වලියුල්ලාහ් (රහ්) - ඉමාම් අබ්දුල් වහාබ් (රහ්)
(3) මව්ලානා ඉල්යාස් (රහ්) - මව්ලානා මව්දූදි (රහ්)
(4) ඉමාම් ඉබ්නු තයිමියා (රහ්) - ඉමාම් බුහාරි (රහ්)
(5) ඉමාම් ඉබ්නු කසීර් (රහ්) - සහීද් සෙයියද් කුතුබ් (රහ්)

**12.** ශ්‍රී ලංකාවේ වෙරළාසන්නයේ මුලින්ම පිහිට වූ මුස්ලිම් ජනාවාස නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.
(1) ත්‍රිකුණාමලය, හම්බන්තොට, පුත්තලම, මන්නාරම වේ.
(2) කොළඹ, බේරුවල, හම්බන්තොට, පොතුවිල් වේ.
(3) යාපනය, ත්‍රිකුණාමලය, මඩකලපුව, කල්පිටිය වේ.
(4) මන්නාරම, බේරුවල, කොළඹ, පුත්තලම වේ.
(5) බේරුවල, මඩකලපුව, කල්පිටිය, පොතුවිල් වේ.

**13.** ඉමාම්වරුන් වන මුස්ලිම් (රහ්), අබූ දාවුද් (රහ්) යන අයගේ උපන් ස්ථාන අනුපිළිවෙළින් පෙන්වන වරණය තෝරන්න.
(1) බුහාරා - සමර්කන්ඩ්
(2) නෛසාබූර් - සිජිස්ථාන්
(3) නෛසාබූර් - බුහාරා
(4) කස්වින් - සමර්කන්ද්
(5) කුරාසාන් - සිජිස්ථාන්

**14.** මක්කාහි පිළිම වන්දනාව හඳුන්වා දුන් පුද්ගලයාගේ නම කුමක් ද?
(1) අම්ර් බින් හල්රම් (2) උබෛයි බින් සලූල් (3) උමයියා බින් හල්ෆ්
(4) අබූ ජහ්ල් (5) අම්ර් බින් ලුහෛ

**15.** මදීනා ශාසනයේ කොන්දේසි අතුරෙන් එකක් වනුයේ,
(1) නබිතුමාගේ නායකත්වය සියළු පාර්ශවයන් විසින් පිළිගැනීම ය.
(2) වසර දහයකට යුධ විරාමයක් ගැනීම ය.
(3) මදීනාවෙන් පිටව නොයාම ය.
(4) මහා පාපයන් සිදු නොකර සිටීම ය.
(5) වසර තුනකින් පසුව උම්රාව සඳහා මක්කාවට යෑමට අවසර දීම ය.

**16.** පහත සඳහන් ප්‍රකාශයන් අතුරෙන් ඉස්ලාම් ශිෂ්ටාචාරයේ විශේෂ ලක්ෂණයක් වන ප්‍රකාශය තෝරන්න.
(1) මෙලොව ජයග්‍රහණය ඉලක්ක කොටගෙන තිබීම.
(2) මුස්ලිම්වරු බහුතරය ලෙස ජීවත්වන ස්ථානවලට පමණක් ගැළපෙන පරිදි සැකසී තිබීමයි.
(3) තාර්කික සංකල්පයක් මත රැඳී සිටීමයි.
(4) මෙලොව, පරලොව ජයග්‍රහණය අරමුණ වී තිබීම ය.
(5) නම්‍යශීලී නොවන, දෘඩ වූ නීතිවලින් යුක්ත වීම ය.

**17.** පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් අබූ මූසා අල්-අෂ්අරී (රළි) තුමා පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) දූමතුල් ජන්දල් සාම සාකච්ඡාවල දී අලි (රළි) ගේ නියෝජිතයෙකු ලෙස කටයුතු කළ පුද්ගලයා ය.
(2) හුදෛබියා සම්මුතිය සිදුවන විට නබිතුමාගේ ලේඛකයා ලෙස කටයුතු කළ පුද්ගලයා ය.
(3) අකබා සම්මුතිය සිදුවන විට මදීනා වැසියන්ගේ නායකයා ලෙස සිටි පුද්ගලයා ය.
(4) ඊජිප්තුව ජයග්‍රහණය කොට ඉස්ලාම් අධිරාජ්‍යයට එය ඒකාබද්ධ කළ පුද්ගලයා ය.
(5) කන්දක් යුද්ධයේ දී නබිතුමා සමග විශේෂඥ උපදෙස් හුවමාරු කළ අයයි.

**18.** 'තලඅල් බද්රු අලෛනා' යන ගීතයෙන් නබිතුමාව පිළිගත් අවස්ථාව කුමක් ද?
(1) මක්කා ජයග්‍රහණය (2) මදීනා ප්‍රවේශය (3) හජ්ජතුල් විදා
(4) බද්ර් ජයග්‍රහණය (5) තායිෆ් නගර ප්‍රවේශය

**19.** පහත සඳහන් ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
A - තෆ්සීර් යන පදය මෙන්ම තඃවීල් යන පදයත් අල්-කුර්ආන් විවරණය හා සම්බන්ධ වේ.
B - දේශ ගවේෂක කොලම්බස්ට ඉන්දියාවට පැමිණීමට මගපෙන්වන්නා ලෙස සිටියේ ඉබ්නු මාජිද් වේ.
C - නබිතුමාගේ සමයේ තෆ්සීර් කලාව තනි ක්ෂේත්‍රයක් ලෙස බිහි වී තිබුණි.
D - හිජ්රතයෙන් පසු නබිතුමා මුහාජිර්වරු හා අන්සාරිවරු අතර සහෝදරත්ව හැඟීම ඇති කළේ ය.
(1) A B (2) A D (3) B C (4) B D (5) C D

**20.** ක්‍රි.ව. 15 සියවස සිට ක්‍රි.ව. 18 සියවස දක්වා යුරෝපයේ වෛද්‍ය විද්‍යාලවල පෙළපොතක් ලෙස භාවිත කළ මුස්ලිම් විද්වතෙකු විසින් රචිත ග්‍රන්ථය කුමක් ද?
(1) අල්-හාවි (2) කිතාබුත් තෛසීර් (3) අල්-කානූන්
(4) අල්-තෆ්සීර් (5) කිතාබුල් ඉක්තිසාද්

**21.** පහත ප්‍රකාශ සලකන්න.
A - ඉස්ලාම් ඉබාදත්වලට පමණක් සීමාකර තිබීම, ඉස්ලාම් ශිෂ්ටාචාරය වර්ධන නොවී පැවතීමට හේතුවක් ලෙස සැලකිය හැකි ය.
B - දීන් ආරක්ෂා කිරීම, පරම්පරාව රැක ගැනීම, ධනය ආරක්ෂාකර ගැනීම යන්න ද හාජියියාත් යන පදයේ ඇතුළත් වේ.
C - මදීනාවෙහි නබිතුමාගේ සමයේ මුස්ලිම්වරු, යුදෙව්වන් හා මුෂ්රික්වරු එකිනෙකා අතර ගනුදෙනුවල නිරත වූහ.
D - අල් අමීන්, අස්-සාදීක් යන අන්වර්ථ නම් නබිතුමාට ලැබුණේ නුබුව්වත් වලින් පසුව ය.
ඉහත ප්‍රකාශවලින් නිවැරදි ප්‍රකාශ ඇතුළත් වරණය තෝරන්න.
(1) A B (2) A C (3) B C (4) B D (5) C D

**22.** පහත දැක්වෙනුයේ අකීදා පදනම්ව සැකසුනු චින්තන කණ්ඩායම්වල අදහස් කීපයකි.
A - මහා පාපයන් කළ අයව අල්ලාහ්ට අභිමත නම් කමාකරයි නැත්නම් දඬුවම් කරයි.
B - අල්ලාහ් නිදසුන් දැක්වීම හා සැසඳීමටත් ඔබ්බට ගිය කෙනෙකි.
C - අල්ලාහ්ගේ දාත්, සිෆාත් වෙන් වූ ඒවා ය.
D - ඉමාම්වරු වැරදි කිරීමෙන් ආරක්ෂා වී ඇත.
E - නිශ්චිත දිනයේ ලෝක අවසානය සිදුවේ. එවිට මිනිසුන් කබුර්වල සිට නැගිටුවනු ලැබේ.
ඉහත ප්‍රකාශවලින් අෂ්-අරියියාවරුන්ගේ මතයන් පමණක් පෙන්වන වරණය කුමක් ද?
(1) A C E (2) A B D (3) B C D (4) B D E (5) C D E

- පහත දැක්වෙනුයේ මුස්ලිම්වරු අතර ප්‍රචලිතව තිබෙන අරාබි වචන කිහිපයකි. ඒවා පදනම් කොටගෙන **23** සිට **25** දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - තක්ලිද් B - මුරීද් C - ඉජ්මා
D - මුහාසබා E - සහීහ් F - හුකුම්
G - මතන් H - මුජාහදා I - ඉස්තිඃෆාර්
J - හල්කා K - ෆර්ළ L - ඉජ්තිහාද්

**23.** ෆික්හු ක්ෂේත්‍ර හා සම්බන්ධ කාණ්ඩය තෝරන්න.
(1) A I (2) A L (3) C J (4) F I (5) J L

**24.** හදීස් ක්ෂේත්‍රය හා සම්බන්ධ කාණ්ඩය තෝරන්න.
(1) A B (2) C D (3) E G (4) F J (5) K F

**25.** තියාස් නීති ක්ෂේත්‍රයේ ප්‍රකාශ **දෙකක්** දැක්වෙන කාණ්ඩය තෝරන්න.
(1) A C (2) C D (3) E F (4) F K (5) J K

Department of Examinations

**26.** කිලාෆත්හි සාමයට බාධාවක් ඇති කරන ලද බවට කරුණු දක්වා කලීෆා උස්මාන් (රළි) තුමා විසින් රටින් පිටුවහල් කළ සහාබිවරයාගේ නම හා පිටුවහල් කළ ස්ථානය පිළිවෙළින්,
(1) සඃද් ඉබ්නු උබාදා (රළි) - නහර්වාන්
(2) අබූ දර් අල් කිෆාරි (රළි) - රබාතා
(3) ඡව්ෆර් බින් අබි තාලිබ් - හබෂා
(4) අම්මාර් බින් යාසිර් (රළි) - කූෆා
(5) මුආවියා බින් අබි සුෆියාන් (රළි) - ෂාම්

**27.** ඉස්ලාම් ශිෂ්ටාචාරය බිහිවීමට පදනම් වූ මූලික අංග පමණක් නිරූපණය වන කාණ්ඩය වන්නේ,
(1) රිසාලත් - සීරා - ඉමාමත් ය.
(2) ඉබාදත් - කිලාෆත් - ඉමාරත් ය.
(3) තෞහීද් - රිසාලත් - මආද් ය.
(4) ඉස්මත් - තස්කියත් - විලායත් ය.
(5) තෞහීද් - සීරා - ඉමාරත් ය.

**28.** 'අහ්ලුත් තෞහීද් වල් අද්ල්' යන්නෙන් හඳුන්වන්නේ කවුද?
(1) ඒකදේව වාදීන් (2) මුඃතසිලාවරු (3) අදේවවාදීන්
(4) නබිතුමාගේ පවුලේ සාමාජිකයින් (5) මද්හබ් අනුගමනය කරන්නන්

**29.** පහත වගුව මගින් ඉස්ලාම් ෂරීආ හි විශේෂ ලක්ෂණ පෙන්වා දී ඇත.

| X | Y |
|---|---|
| (1) රබ්බානියියා | A - ජාත්‍යන්තරකරණය වූවකි |
| (2) ෂුමූලියියා | B - පොදු ලක්ෂණ සහිතයි |
| (3) වසතියියා | C - දේවත්වයෙන් යුක්තය |
| (4) ආලමියියා | D - මධ්‍යස්ථ බවින් යුක්තය |
| (5) උමූමියියා | E - පරිපූර්ණත්වයෙන් යුක්තය |

ඉහත X තීරුවේ ඇති අරාබි වචනවලට අනුරූපව Y තීරුවේ ඇති අර්ථ අනුපිළිවෙළින් ගැළපූ විට ලැබෙන වරණය වන්නේ,
(1) A B E D C (2) A C B E D (3) B A C D E
(4) C E D A B (5) C D A B E

**30.** පහත සඳහන් X තීරුවට අනුව Y තීරුවේ වචන නිවැරදිව සම්බන්ධ කිරීමේ දී පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

| X | Y |
|---|---|
| (1) අල්-හාවි | A - අලි බින් සීනා |
| (2) තාරික් තමත්දුන් | B - ඉබ්නු අබ්දිරබ්බිහි |
| (3) ඉක්දුල් ෆරීද් | C - ජූර්ජි සෛදාන් |
| (4) අල්-කානූන් | D - අල්-මජීසි |
| (5) කිතාබුල් මාලික් | E - සකරියියා අර්-රාසි |

(1) A B E D C (2) A C B E D (3) C B E A D
(4) E B A D C (5) E C B A D

**31.** 'ඉල්මුල් ජරහ් වත්තඃදීල්' යන්න පහත කුමන ක්ෂේත්‍රය හා සම්බන්ධ වන්නේ ද?
(1) ෆික්හ් (2) හදීස් (3) භූගෝල විද්‍යාව
(4) තසව්වුෆ් (5) තාරකා විද්‍යාව

**32.** ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල සහිරා විද්‍යාල ශාඛා බිහිකිරීමට මුල් වූ ප්‍රභූවරයා කවුද?
(1) ආචාර්ය T.B. ජායා (2) ආචාර්ය බදියුදීන් මහ්මූද්
(3) ආචාර්ය A.M.A. අසීස් (4) දොස්තර M.C.M. කලීල්
(5) සර් රාසික් ෆරීද්

Department of Examinations

**33.** හුදෛබියා සම්මුතියෙන් පසුව රෝම රජුට නබිතුමාගේ ලියුම රැගෙන ගිය සහාබි වන්නේ,
(1) අබ්දුල්ලා බින් ජහ්ෂ් (රලි) ය. (2) සයිද් බින් සාබිත් (රලි) ය.
(3) හාරිස් බින් උමෛර් (රලි) ය. (4) අබූ හුසෛමා අල් -අන්සාරි (රලි) ය.
(5) සෑද් බින් උබාදා (රලි) ය.

**34.** නුසෛරි ලෙස හඳුන්වන්නේ,
(1) ෂිආවරුන්ගෙන් එක් පාර්ශවයකි.
(2) මුඃතසිලාවරුන්ගේ එක් පාර්ශවයකි.
(3) කාරිජීවරුන්ගේ එක් පාර්ශවයකි.
(4) ස්පාඤ්ඤයේ ඇති කුඩා මුස්ලිම් රාජ්‍යයන්ගෙන් එකකි.
(5) ඉන්දියාවේ ඇති කුඩා මුස්ලිම් රාජ්‍යයන්ගෙන් එකකි.

**35.** පහත කාණ්ඩවලින්, අරාබි අක්ෂර වර්ග පමණක් සඳහන් වන වරණය තෝරන්න.
(1) අර්-රිකා, අල්-මුත්ආ, අල්-මුහක්කික්
(2) නස්තලික්, තව්කි, සීනත්
(3) කුෆි, නස්හු, සුලුසි
(4) අල්-මුහක්කින්, රයිහානි, මිස්මාර්
(5) රයිහානි, මිස්මාර්, හත් බාබුරි

**36.** පහත පාලකයන් අතුරෙන් තජ්දීද් සේවයේ පුරෝගාමීව සිටි පුද්ගලයා වන්නේ,
(1) ඉමාම් අබ්දුල්ලා බින් සුහ්රි (රහ්) වේ.
(2) කලීෆා උමර්බින් අබ්දුල් අසීස් (රහ්) වේ.
(3) මව්ලානා ෂාහ් වලියුල්ලාහ් (රහ්) වේ.
(4) ඉමාම් ෆුලෛල් බින් ඉයාල් (රහ්) වේ.
(5) ඉමාම් ගස්සාලි (රහ්) වේ.

**37.** ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කථානායක ලෙස කටයුතු කළ මුස්ලිම්වරු දෙදෙනෙකු වන්නේ,
(1) එස්.එච්. ඉස්මායිල් - බාකිර් මාකර් වේ.
(2) ආචාර්ය බද්ඊද්දීන් මහ්මුද් - දොස්තර එම්.සී.එම්. කලීල් වේ.
(3) ආචාර්ය ටී.බී. ජායා - එම්.එච්.එම්. අෂ්රෆ් වේ.
(4) එම්.එච්. මුහම්මඩ් - ඒ.සී.එස්. හමීද් වේ.
(5) එම්.එල්. අබුසාලි - එම්.එච්. නයිනා මරික්කාර් වේ.

**38.** අල්-කුර්ආනය, රිද්මයානුකූලව ලෙස පාරායනය කිරීම වෙනුවෙන් නබිතුමා විසින් ආශිංසනය කළ සහාබිගේ නම කුමක් ද?
(1) අබූ මූසා අල්-අෂ්අරි (රලි) (2) අබූ දර් අල්-කිෆාරි (රලි)
(3) අබූ සඊද් අල්-කුද්රි (රලි) (4) අබූ අයියූබ් අල්-අන්සාරි (රලි)
(5) අබූ උබෛදා අල්-ජර්රාහ් (රලි)

**39.** පහත සඳහන් අයගෙන් අල්-කුර්ආනය ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කළ විද්වතා
(1) මැල්කම් වේ. (2) පික්තාල් වේ.
(3) කැට්ස්ටීවන් වේ. (4) මාටින් ලින්ක්ස් වේ.
(5) මොරිස් බුකෙල් වේ.

**40.** මුජ්තහිද්වරුන් අතර මතභේද ඇතිවීම
(1) අනිවාර්ය වේ. (2) වැරදි ය.
(3) මගහැරිය නොහැක්කකි. (4) දඬුවම් ලැබිය හැකි ය.
(5) හැකියාවක් නොමැත.

**41.** කියාස් යන උප මූලාශ්‍ර පිළිබඳව වඩාත් නිවැරදි ප්‍රකාශය වන්නේ,
(1) හදීස්හි පමණක් රැඳී තිබීම
(2) තාර්කිකත්වය පිළිගැනීම
(3) මුජ්තහිද් සියලු දෙනාගේ අනුමැතිය අපේක්ෂා කර සිටීම
(4) ඉමාම්වරුන්ගේ නිශ්ශබ්ද අනුමැතිය ප්‍රමාණවත් කොට සැලකීම
(5) ඉබාදත්, මුආමලාත් සියල්ලෙහි භාවිත කිරීමට හැකිවන පරිදි තිබීම

Department of Examinations

**42.** පහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි ප්‍රකාශ තෝරන්න.

A - "අල්ලස් ගන්නන් හටත් අල්ලස් දෙන්නන් හටත් අල්ලාහ්ගේ ශාපය ඇත" යන්න ඉමාම්වරුන්ගේ ප්‍රකාශයකි.

B - "සම්පත් ඇතැම් අයගේ දෑත්වල නොරැඳිය යුතු ය. ඒවා ජනයා අතර සංසරණය වන්නක් ලෙස තිබිය යුතුය" යන්න ඉස්ලාම් මතය වේ.

C - මදීනා ශාසනය මගින් නබිතුමාගේ නායකත්වය පිළිගැනීමට හේතු වූ අතර මදීනාහි ජීවත් වූ සියලු ජනයාගේ අයිතීන් තහවුරු කරන ලදී.

D - 'ළමයින් මරන්නේ නැත' යන කොන්දේසිය හුදෛබියා සම්මුතියේ එකතුකොට තිබුණි.

(1) A B (2) A C (3) A D (4) B C (5) C D

**43.** යමෙකු තමාගේ ආහාර (රිස්ක්) විස්තීරණය කරගැනීමටත්, ආයුෂ දීර්ඝ කරගැනීමටත් කැමති වේ ද, එසේනම් ඔහු සම්බන්ධ වී ජීවත් විය යුතු යයි නබිතුමා සඳහන් කළ අය කවරෙක් ද?

(1) වයෝවෘධයින් (2) අසල් වැසියන් (3) ලේ ඥාතීන්
(4) කුඩා ළමයින් (5) මුස්ලිම්වරු

**44.** පහත සඳහන් නීති මූලාශ්‍රයන් අතුරෙන් ඉස්තිහ්සාන් තීරණය ගැනීමට ආධාරවන නීති කාණ්ඩය තෝරන්න.

(1) කියාස්, උර්ෆු, මස්ලහා (2) කව්ලුස්සහාබා, උර්ෆු, ෂද්දුද් දරීආ
(3) කියාස්, මස්ලහා, කව්ලුස් සහාබා (4) උර්ෆු, ෂත්තුත් දරීආ, ශරුළ, මන් කබ්ලනා
(5) මස්ලහා, ෂද්දුද් දරීආ, කව්ලුස් සහාබා

**45.** මෝගල් පාලකයා ඖරංගසීබ් තුමා සමයේ සම්පාදනය කළ ඉස්ලාම් නීති ග්‍රන්ථය වන්නේ,

(1) ෆතාවා ඉබ්නු තෛමියා ය. (2) තොලුකෙ අඩවු ය.
(3) ෆත්හුද් දයියාන් ය. (4) ෆතාවා මුආසරා ය.
(5) ෆතාවා ආලම් කීරි ය.

- අංක **46** සිට **50** දක්වා ප්‍රශ්නවලට අදාළ ව ප්‍රකාශ දෙක බැගින් දී ඇත. එක් එක් ප්‍රශ්න අංකයට අදාළ ව දී ඇති ප්‍රකාශ යුගලය සම්බන්ධයෙන් පහත සඳහන් (1), (2), (3), (4), (5) යන වරණවලින් වඩාත් ගැළපෙන යුගලය සහිත වරණය තෝරා එහි අංකය පිළිතුරු පත්‍රයේ සලකුණු කරන්න.

| අංකය | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| (1) | නිවැරදි ය. | නිවැරදි ය. |
| (2) | නිවැරදි ය. | වැරදි ය. |
| (3) | වැරදි ය. | වැරදි ය. |
| (4) | වැරදි ය. | නිවැරදි ය. |
| (5) | නිවැරදි ය. | නිවැරදි වන අතර පළමු ප්‍රකාශය තවදුරටත් විග්‍රහ කෙරේ. |

| | පළමු ප්‍රකාශය | දෙවන ප්‍රකාශය |
|---|---|---|
| **46.** | බානත් සුආද් යන ගීතය ගැයූ ගායක සුහෛල්, නබිතුමා ගේ ප්‍රශංසාවට පාත්‍ර වූවෙකි. | ඉජ්මා කිරීමට එකකට වඩා වැඩි වූ මුජ්තහිද් තිබිය යුතුය යන්න එක් නිර්ණායකයකි. |
| **47.** | ඉමාම් ජඃෆර් බින් සාදික්ගේ පුත්‍රයා වූ ඉමාම් ඉස්මායිල් නමැත්තාව අනුගමනය කරන්නන් ඉස්මාඉලියියාවරු වේ. | අල් හම්රා මාලිගාව, අහ්මර් විසින් ස්පාඤ්ඤයේ නිර්මාණ කරන ලදී. |
| **48.** | ඉඳගැනීමට ඉඩ දෙන පුටුව මෙන් ප්‍රතිවිරුද්ධ අදහස් ද පවති යන්න මුස්තෆා අහමද් සර්ක්කා සඳහන් කර ඇත. | කලීෆා මුආවියා (රළි) තුමා හදීස් එක්රැස් කිරීමේ කාර්යයට ඉමාම් සුහ්රි (රහ්) තුමාව යොදවා තිබුණේ ය. |
| **49.** | හොඳ කියා දී වැරදි වැළැක්වීමේ දී පිරිමි හා ස්ත්‍රීන් සමාන වගකීම් ඇති අය වේ යන්න ඉස්ලාමීය මතය වේ. | තජ්දීද් කටයුතු සාමූහිකව හා තනිවම ද සිදුවිය හැකි ය. |
| **50.** | අලි (රළි) තුමා නජ්රාන් ප්‍රදේශයේ කිතුනුවන් හා ඇතිකර ගත් ගිවිසුම නජ්රාන් ගිවිසුම ලෙස හැඳින්වේ. | අයිෂා (රළි) හෆ්සා (රළි) දෙදෙනා පිළිවෙළින් කලීෆාවරුන් වන අබූ බක්කර් (රළි) උමර් (රළි) යන අයගේ දූවරුන් වේ. |

* * *

Department of Examinations

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
**අ.පො.ස. (උ.පෙළ) විභාගය/ க.பொ.த. (உயர் தர)ப் பரீட்சை - 2020**

**නව නිර්දේශය/ புதிய பாடத்திட்டம**

| විෂයය අංකය<br>பாட இலக்கம் | 47 | විෂයය<br>பாடம் | ඉස්ලාම් ශිෂ්ඨාචාරය |
|---|---|---|---|

## ලකුණු දීමේ පටිපාටිය/புள்ளி வழங்கும் திட்டம்
## I පත්‍රය/பத்திரம் I

Department of Examinations

| ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. | ප්‍රශ්න අංකය<br>வினா இல. | පිළිතුරු අංකය<br>விடை இல. |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. | 3 | 11. | 5 | 21. | 2 | 31. | 2 | 41. | 2 |
| 02. | 2 | 12. | 4 | 22. | 1 | 32. | 1 | 42. | 4 |
| 03. | 2 | 13. | 2 | 23. | 2 | 33. | 3 | 43. | 3 |
| 04. | 1 | 14. | 5 | 24. | 3 | 34. | 1 | 44. | 1 |
| 05. | 3 | 15. | 1 | 25. | 4 | 35. | 3 | 45. | 5 |
| 06. | 1 | 16. | 4 | 26. | 2 | 36. | 2 | 46. | 1 |
| 07. | 3 | 17. | 1 | 27. | 3 | 37. | 1 | 47. | 1 |
| 08. | 2 | 18. | 2 | 28. | 2 | 38. | 1 | 48. | 2 |
| 09. | All | 19. | 2 | 29. | 4 | 39. | 2 | 49. | 1 |
| 10. | 2 | 20. | | 30. | 5 | 40. | 3 | 50. | 4 |

✪ **විශේෂ උපදෙස්/ விசேட அறிவுறுத்தல் :**

**එක් පිළිතුරකට/ ஒரு சரியான விடைக்கு ලකුණු 02 බැගින්/புள்ளி வீதம்**
**මුළු ලකුණු/மொத்தப் புள்ளிகள் 2 × 50 = 100**

## ඉස්ලාම් ශිෂ්ටාචාරය
## නව නිර්දේශය

## I කොටස

**1.** (i) හදීස් නිර්දේශිත නීති මූලාශ්‍රයක්ය යන්න තහවුරු කෙරෙන අල්-කුර්ආනයේ දැක්වෙන සාධක **දෙකක්** සඳහන් කරන්න.

අල් කුර්ආනය උපුටා කරුණු දෙකක් සඳහන් කරන්න.

- ඔබලා අල්ලාහ්ට අවනත වෙන්න. එවගේම අල්ලාහ්ගේ දූතයානන්ට ද අවනත වෙන්න.
- ඔබලාගේ දූතයානන්ගෙන්වූ දේ පිළිගන්න. ඔහු වැළැක්වූ දේ වලින් මිදෙන්න.

**(2 X 2 = 4)**

(ii) හදීසයක් ප්‍රතික්ෂේප කිරීම පදනම් වන කරුණු **දෙකක්** සඳහන් කරන්න.

රාවිවරුන්ගේ අඩුපාඩුව

- ඉස්නාද්හි ඇතිවන විසන්ධිය
- අවස්ථාවන්වලදී ඇතිවෙන දුර්වලතාවය

**(2 X 2 = 4)**

(iii) ගොතන ලද හදීස් බිහිවීමට හේතු **හතරක්** සඳහන් කරන්න.

- දේශපාලනික කරුණු
- සින්දීත්වරුන්ගේ ක්‍රියාවන්
- භාෂාව, ජාතිය, ප්‍රදේශය
- ෆික්හ්, ඉල්මුල්තලාම්, යනාදී කරුණුවලින් ඇති වූ මතභේද
- ආර්ථික අභිලාශයන්
- කතන්තර කියන්නන්

**(1 X 4 = 4)**

Department of Examinations

(iv) මුතවාතිර්, ආහාද් යන හදීස් වර්ග ගැන කෙටියෙන් විස්තර කරන්න.

<u>මුතවාතිර්</u>

- මුතවාතිර් කියන්නේ විශ්වසනීය රාවිවරු වැඩි දෙනෙක් ප්‍රකාශ කරපු හදිස් ය.

<u>ආනාද්</u>

- මුතවාතිර්වවලට සමාන නොවූ අඩු පිරිසක් වන රාවිවරුන්ගෙන් දැනුම් දෙන ලද හදිස් ය.

**(2 X 2 = 4)**

Department of Examinations

(v) හදීස් ක්ෂේත්‍රයේ වර්ධනයට ඉමාම් බුහාරි (රහ්) තුමා ලබාදුන් දායකත්වය විස්තර කරන්න.

- ඉමාම් බුහාරි පිළිබඳ හැඳින්වීම
- හදිසය ගොනු කළ ඉමාම්වරයෙක්
- ඉස්හාක් ඉබ්නු රාඩවෙයිහි. අලි ඉබ්හු මදිනී, අග්මදි ඉබ්හු හම්බල් යන අය ගේ ශිෂ්‍යයා ය.
- ජාමිඋ සහීහ් යන ග්‍රන්ථයේ කතෘවරයාය
- සහීහ් බුහාරියේ ඇතුලාන්තය ගැන විස්තරය
- අල්කුර් ආනයට පසු පිළිගත හැකි ග්‍රන්ථයකි
- දක්ෂ ශිෂ්‍යාවරුන් බිහි කිරීම (ඉමාම් මුස්ලිම්, ඉමාම් අබුදාවුද් යන අය)
- තහවුරු කරන ලද හදිසය පෙන්නුම් කර ගත හැකි නීති මාලාවක් සැකසීම

**(1 X 4 = 4)**

**(මුළු ලකුණු 20)**

**2.** (i) කිලාෆතුර්රාෂිදාහි පළමු කලීෆාවරුන් දෙදෙනා තෝරන ලද ක්‍රම සඳහන් කරන්න.

අබුබක්කර් (රළි)

- සකීෆා බනී සර්දාහි ජනමත විචාරනයෙන් තෝරා පත් කරන ලදී.

උමාර් (රළි)

- තනතුරේ සිටි කලීෆාවරයා ප්‍රමුඛ සහාබවරුන් සමග අදහස් හුවමරු අනුව දෙවෙනි කලීෆා වශයෙන් උමර් (රළි) තුමා පත් කරන ලදී.

**(2 X 2 = 4)**

(ii) කලීෆා අබූ බක්කර් (රලි) තුමා කිලාෆතය භාර ගැනීමෙන් පසුව කළ දේශනය කෙටියෙන් සඳහන් කරන්න.

- මා කිලාෆතයට ආශාවෙන්නට හෝ කැමැත්තක් නොදැක්වූවේ ය.
- කලහකාරි තත්ත්වයක් පිළිබඳ බියක් නිසා මා කිලාෆපතය භාර ගත්තෙමි.
- නායකත්වයෙන් මා කෙරෙහි කිසියම් ලාභයක් නෙැලැබෙන්නේ ය. (ප්‍රතිලාභ)
- මා ඔබලාට වඩා උසස් කෙනෙක් නොවේ ය. මම හොඳක් කළොත් මා කෙරෙහි සහයවන්න. මා වරදක් කළොත් මා නිවැරදි කරන්න.
- ඔබලාගේ දුර්වල පුද්ගලයා මා හට ශක්තිමත් ය. අල්ලාහ්ට සහ ඔහුගේ දේව දූතයාට විශ්වාසනීය අනුව මා ක්‍රියාකළොත් මා හට සහයවන්න. නැතහොත් මාව ඉවත්කරන්න.

**(1 X 4= 4)**

(iii) කලීෆා උමර් (රලි) තුමාගේ පාලන සමයේ රාජධානිය ව්‍යාප්ත වූ ආකාරය ගැන පැහැදිලි කරන්න.

- සිරියාව, ඊජිප්තුව, පලස්තීනය යනාදී රෝමානු ප්‍රදේශයන් ජයග්‍රාහි කර ගැනීම (ප්‍රධාන සටන්යර් මුක්- කාලිද්ඉබ්නුවලීද්)
- ඉරානය, ඉරාකය, මදාඉන්, ඉස්ෆහාන් යන ප්‍රදේශයන් ජයග්‍රහණය කිරීම ප්‍රධාන සටන කාදිසියියා සඅද් ඉබ්නු අබි වක්කාස්)

**(2 X 2 = 4)**

(iv) උමයියා කලීෆාවරු රටේ පරිපාලනයේ ඇති කළ වෙනස්කම් **හතරක්** විස්තර කරන්න.

- කලීෆාවරු තෝරා ගැනීමෙහි සිදු වූ වෙනස්කම්
- මජ්ලිසුශ් ශූරාවෙහි සිදු වූ වෙනස්කම්
- අග නුවරෙහි ඇති වූ වෙනස්කම්
- රෝමානු පරිපාලන ක්‍රමය හැඳින්වීම
- පොදු ජීවිතයෙහි ඇතිවූ වෙනස්කම්
- බෛතුල්මාල් පාලකවරුන්ගේ යහපතට භාවිත කිරීම
- අරාබි භාෂාවට ප්‍රමුඛත්වය ලබාදීම

**(1 X 4 = 4)**

(v) කලීෆා අබ්දුල් මලික්, උමයියා කිලාෆතය ස්ථිර කිරීමට ලබා දුන් දායකත්වය අගය කරන්න.

Department of Examinations

- කාලිද්ගෙ අභියෝගය (අගනුවරින්)
- මුක්තාර් ගේ අභියෝගය (කුෆාවෙහි)
- අබ්දුල්ලා බින් සුබෙයිර් (හිජාස්)
- රෝමානුවන්ගේ තර්ජනය
- කාරිජිවරුන් (විවිධ ප්‍රදේශවල)
- මෙවැනි තමන්ගේ රාජතන්ත්‍රය අනුව සියලුම අභියෝගවලින් ජයග්‍රාහි කර උමෛය්යා කිලාෆතය ස්ථිර කර ගැනීම
- උමෛයා කිලාපත්නි දෙවෙනි නිර්මාතෘවරයා ය.

**(1 X 4 = 4)**

**(මුළු ලකුණු 20)**

Department of Examinations

**3.** (i) මුස්ලිම්වරුන් සංගීත ක්ෂේත්‍රයට හඳුන්වාදුන් සංගීත භාණ්ඩ **හතරක්** සඳහන් කරන්න.

- ඌද් (යාල් ට සමාන සංගීත භාණ්ඩ)
- මිස්මාර් (පුල්ලාංකුලලට සමාන සංගීත භාණ්ඩ)
- තබ් (රබානයට සමාන සංගීත භාණ්ඩ)
- තබ්ල් (මේලම්)

**(1 X 4 = 4)**

(ii) ඉස්ලාම් හි සංගීතය අනුමත කර තිබේ ද යන්න විස්තර කරන්න.

- සංගීතය යනු මනුෂ්‍ය ස්වභාවය සමග ගැටී යන අංගයන් ය.
- මනුෂ්‍ය යහපතට හානි නොවන විරසක නොවන ඉස්ලාමීය මූලධර්මයට සහ ඉබාදත්වලට හානි නොවන සරල ආඩම්බර නොවන සංගීතය, සීමාවට යටත්ව අනුමත කළ හැකි යයි බොහෝ විද්වතුන්ගේ මතයයි.
- උපකරණවලින් ඇති කරන සංගීතය හරාම් යනු ප්‍රකාශ කරන විද්වතුන් ද ඇත.
- සංගීතය හරාම් වේ. සමහර අවස්ථාවල එය අනුමතයි යන කරුණු ඉදිරිපත් කරන අය ද සිටී.

  (සටහන : ශිෂ්‍යයින් විසින් ඉදිරිපත් කරන අදහස් මූලාශ්‍ර සහිත ඉදිරිපත් කරන ලද පරීක්ෂා කර ලකුණු සපයන්න.)

**(2 + 2 = 4)**

(iii) උමයියා අබ්බාසි සමයන්හි නිර්මාණය කරන ලද බලකොටු **දෙකක්** පිළිබඳව විස්තර කරන්න.

- මුආවියා (රලි)තුමානන් විසින් නිර් මාණය කළ දාරුල් ඉමාරා (බලකොටුව) ඩමස්කස්.
- කලීෆා වලීද් බින් අබ්දුල් මලික් විසින් නිර්මානය කළ කුසෙයිර් හම්රා - ජොර්දානය.
- අබූ ජඃෆර් අල් මන්සූර් විසින් ඉදි කරන ලද කස්රු සහෆ් (බල කොටුව) බැග්ඩාඩය.
- අබූජඃෆර් අල්මන්සූර් විසින් ඉදි කරන ලද කස්රුල් හුල්ද් - යූප්රතීස්.
- කලීෆා වාසික් විසින් නිර්මාණය කළ කස්රුල් හානි සාම්රා බලකොටුව.

(සටහන : මෙයින් දෙකක් හෝ අනෙකුත් බලකොටු පිළිබඳව විස්තර)

**(2 X 2 = 4)**

(iv) අක්‍ෂර කලාව කෙරෙහි මුස්ලිම්වරුන් උනන්දුව දැක්වීමට හේතු වූ කරුණු **දෙකක්** පැහැදිලි කරන්න.

- අල්කුර්ආන් සුත්තාවෙහි උනන්දු දැක්වීම.
- අලංකාර අක්ෂරවලින් අල්කුරානයේ වැකි ලිවීම පිනක් සේ සැලකීම.
- සෞන්දර්ය හැඟීම් ඉදිරිපත් කරන්නට හේතුවක් සේ සැලකීම.
- පාලකවරුන්ගෙන් ලැබුණු දිරි ගැන්වීම.
- අරාබි අක්ෂරවල දක්නට ලැබෙන නම්‍යශීලීභාවය.

**(2 X 2 = 4)**

(v) අරාබි අක්‍ෂර කලාවෙහි අර්-රිකා හා අන්-නස්හු ගැන කෙටියෙන් විස්තර කරන්න.

- අර් රිකා
  - ¾ ක කොටසක් නම්‍යශීලිභාවයෙන් යුත් ඉරි.
  - තුනීභාවය, තිත් රහිත.
  - කියවීමට අපහසු.
  - වේගයෙන් ලියවීමට හැකිය.
  - අක්ෂරකලාවේ අභ්‍යන්තරභාවයට සරලයි.
- අන් නස්කු
  - ගෝලාකාරයෙන් සහිතය.
  - තිත්, ........
  - සැහැල්ලුවෙන් කියවීමට හැකි ය.
  - සනකම් රහිතය, අනුමත කරන ලද සන්නිවේදනවලට භාවිත කරන ලදී.
  - (1/3) ක කොටස් දික් ඉරි සහිතයි.

**(2 X 2 = 4)**

Department of Examinations

**(මුළු ලකුණු 20)**

## II කොටස

**4.** (i) වෛද්‍ය ක්ෂේත්‍රයේ වර්ධනයට මුස්ලිම් විද්වතුන් දෙදෙනෙක් සිදු කළ දායකත්වය විස්තර කරන්න.

- වෛද්‍යවරයා පිළිබඳ හැඳින්වීම.
- වෛද්‍ය ග්‍රන්ථය.
- වෛද්‍ය සොයාගැනීම්.
- වෛද්‍ය ක්ෂේත්‍රය පිළිබඳ අදහස්.

**(ලකුණු 10)**

(ii) කලීෆා මෑමූන් සමයේ තාරකා විද්‍යා ක්ෂේත්‍රයේ ඇති වූ වර්ධනය පැහැදිලි කරන්න.

කලීෆා මාමූන්ගේ විද්වත් ක්ෂේත්‍රයේ උනන්දුව.

- බෛතුල් හික්මාවෙහි දායකත්වය.
- පරිවර්තන ක්‍රියාවලිය.
- තාරකා විද්‍යාව පර්යේෂණ.
- තාරකා මධ්‍යස්ථාන පිහිටුවීම.
- මාමුත් සමයේ තාරකා විද්වතුන් පිළිබඳ විස්තර (අහමද් අල් ෆර්හාන් - හරකාන් අස්සමාවියියා)
- මුහම්මද් අහ්මද් හසන් යන් අය වෙනුවෙන් නියෝග (භූගෝල වට ප්‍රමාණ, දවල් හා රාත්‍රී සමානත්වය )
- මාමුත්ගේ තාරකා විද්‍යා ක්ෂේත්‍රයට කළ දායකත්වය සලකා නවීන විද්‍යාව චන්ද්‍රයාගේන් කොටසකට මාමුත්ගේ නම තැබීම.

**(ලකුණු 10)**

**(මුළු ලකුණු 20)**

**5.** (i) ඉස්ලාම් කිලාෆතයේ ගෝත්‍රික විසංවාද ඇති කළ බලපෑම් විමසන්න.

ගෝත්‍රය (අසබිය්යත්) පිළිබඳ හැඳින්වීම.

ගෝත්‍රික දැඩි ස්ථාවරය තුරන් කිරීමට නබිතුමානන් ගත් ක්‍රියාමාර්ගය ගැන කෙටියෙන් හැඳින්වීමක් කරන්න.

ප්‍රතිවිපාක



Department of Examinations

- කිලාෆත්නෙහි බිඳවැටීම් . පවුල් පාලන බිහිවීම.
- ගෝත්‍රිකය හේතු කොට සුලු පාලන බිහිවීම.
- මුස්ලිම්වරුන් අතර අභ්‍යන්තර ගැටුම් ඇතිවී ජීවිතහානි සිදුවීම.
- මුස්ලිම්වරුන්ගේ එක්සත් කම පළුදුවී බැලහීනත්වයට පාත්‍ර වීම.
- ඉස්ලාමීය කිලාෆත් පාලනය බිඳ වැටීම.

(ii) කුරුස යුද්ධ, ඉස්ලාම් ලෝකයේ ඇති කළ බලපෑම් විස්තර කරන්න.

කුරුස යුද්ධය ගැන කෙටි හැඳින්වීම.

- 1099 වසරේ බෛතුල් මුකද්දස් ගිලිහීයෑම
- 1181 වසරේ සුල්තාන් සලාහුද්දීන් එය නැවත ජය ගැනීම.
- යුද්ධයක් ඇතිවී ජීවිත හානි සහ දේපළ අහිමිවීම.
- මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපනය හා චින්තන වල වර්ධනය පහළ වැටීම.
- මුස්ලිම් පාලනය අක්‍රියවී බිඳවැටීම.
- මුස්ලිම්වරුන්ගේ ආර්ථික සම්පත් සූරාකෑමට ලක්වීම.
- ඉස්ලාම් නොහොත් මුස්ලිම් පිළිබඳ හැඳින්වීමක් යුරෝපානුවන් විසින් ලබාගැනීම.
- සංස්කෘතිය හා ශිෂ්ඨාචාරය හුවමාරුවීම.
- ආගමානුකූල වෛරය ශක්තිමත් වීම.
- මුස්ලිම්වරුන්ගේ අධ්‍යාපනය සහ තාක්ෂණ දැනුම යුරෝපානුවන් විසින් ලබගැනීම.
- යුධ තාක්ෂණයේ වර්ධනයක් ඇතිවීම

**(ලකුණු 10)**
**(මුළු ලකුණු 20)**

**6.** (i) මුඃතසිලා සහ අෂ්-අරියියා චින්තන අතර දක්නට ඇති වෙනස්කම් සංසන්දනය කරන්න.

| මු:තසිලා | අශ්-අරියියා |
|---|---|
| සාත් සහ සිෆාත්ය බෙදීමට නොහැකිය. | සාත් සහ සිෆාත් වෙන්කිරීමට හැකිය. |
| අල්ලාහ් දෙවියන් මෙලොව සහ පරලොව නොදැකිය හැකිය. | අල්ලහ්ගේ ගැතිවරුන්ට පරලොවේදී අල්ලාහ්ව දැකගන්නට පුළුවන්. |
| අල්කුරානය මැවුම්කරන ලද්දකි. | අල්කුරානය පහල කල එකකි. |
| මිනිසා සම්පූර් ණ ක්‍රියා නිදහස් ලැබූවකි. | මිනිසාට නිදහස සීමා සහිතයි. |
| මහා පව්කාරයා මුහ්මින් සහ කාෆිර් අතර වේ. | මහා පව්කාරයා වැරදිකාරයා වේ. |
| ශෆාඅත් පිංකාර අයට පමණයි. | අල්ලාහ්ගේ කැමැත්ත අනුව සමාවද/ දඬුවමද ලැබිය හැකිය. සෆාඅතය මුස්ලිම්වරුන්ට පොදු දෙයකි. |
| යහමග පෙන්නුම්කර පව් නතර කිරීම ෆර්¨ අයින්ය. | යහමග පෙන්නුම්කර පව් නතර කිරීම ෆර් ලු කිෆායා වේ. |

Department of Examinations

| | |
|---|---|
| මිනීවල තුල ප්‍රශ්න කිරීම් වේදනාව නොමැත | මිනීවල තුල ප්‍රශ්න කිරීම් වේදනාව ඇත. |

**Note:** මෙලෙස සංසන්දනය කර විස්තර කල යුතුයි.

(ලකුණු 10)

(ii) ෂිආවරුන්ගේ උප කොටස් වූ නුසෙරිවරුන් හා බාතිනීවරුන් පිළිබඳව පැහැදිලි කරන්න.

<u>නුසෙරිවරුන්</u>

- නුසෙරිවරුන් ෂිආවරුන්ගෙන් කොටසකි.
- මුහම්මද් බින් නුසෙ යන අයගෙන් නිර්මාණ කල එකකි.
- මේ පිරිස අලවිවරුන් වශයෙන්ද නම් කරයි.
- ෂිආවරුන් අතර දැඩි ස්ථාවරයකින් පෙළඹුණු අය.
- අලි (රළි ) තුමානන්ට දේව බලය තිබෙයැයි සඳහන් කරයි.
- වර්ථමාන සිරියානු පාලන තන්ත්‍රයට ඇතුළත්ය.

<u>බාතිනිවරුන්</u>

- ඉස්මායිලීයාවරුන්ගෙන් බිහිවූ උපකොටසකි.
- කූෆාවෙහි සැඟවී ජීවත්වෙන කෙනෙක්ගේ දේශනයෙන් බිහිවූ පිරිස.
- ෂිආවරුන් අතර දැඩි ස්ථාවරයෙන් ජීවත්වන අය.
- හලාල් හරාම් අංගවල සීමාවෙන් ඔබ්බට ගිය පිරිස (මත්පැන් හලාල් යනුවෙන් පිළිගත් අය )
- සලාතය වේලාවන් සීමා කරගත් අය.
- තමන්ගේ මතයට විරුද්ධ වෙන අයව අතවරය කරන්නට තරම් දැඩි මත දරන පිරිසකි.

(ලකුණු 10)
(මුළු ලකුණු 20)

**7.** (i) ශ්‍රී ලංකාවට ඉස්ලාමය හඳුන්වා දුන් ආකාරය මූලාශ්‍ර සහිතව විස්තර කරන්න.

- ශ්‍රී ලංකා අරාබි සම්බන්ධතාව පිළිබඳව ඉදිරිපත් කිරීම.
- නබිතුමානන්ගේ සමයේදී ඉස්ලාමය හැඳින්වීම.
- අකුබෝදී රජතුමානන්ගේ දූතය.

Department of Examinations

- හාෂිම්වරුන්ගේ පැමිණීම.
- සිංද් කෙරෙහි බල ඇණිය යැවීමේ පසුබිම (අල් බලාදූරිගේ සටහන )

**(ලකුණු 10)**

(ii) ශ්‍රී ලංකාව ජාත්‍යන්තරය හා සම්බන්ධ කිරීමට මුස්ලිම්වරුන් දුන් දායකත්වය විස්තර කරන්න.

- ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩවලට ජාත්‍යන්තරයේ මිල තීරණය කිරීම.
- ලංකාවේ කේන්ද්‍ර ප්‍රමුඛත්වය (අරාබි වෙළඳුන් ලංකාවට පැමිණ අරාබි ඉතිහාසඥයින් රටවල් සොයාගෙන යෑම) අල් බලාදූරිගේ ගමන්වල ලංකාව පිළිබඳව සටහන්.
- රජවරුන්ගේ දූත පිරිස් වශයෙන් වැඩකිරීම.(අබූ උස්මාන් ඊජිප්තුව)
- ඉන්දියානු පාලක නවාබ්ට එවූ පණිවුඩය. (උස්මාන් ලෙබ්බෙයි)
- දීර්ඝ ඉතිහාසයේ හජ් සමයේ විදෙස් වලින් හජ්වලට පැමිණෙන පිරිසට ලංකාව පිළිබඳව විස්තර කිරීම.
- තේ, මැණික් යන ද්‍රව්‍යයන් අරාබි, යුරෝපානු ප්‍රදේශ වල හැඳින්වීම් කිරීම.

**(ලකුණු 10)**
**(මුළු ලකුණු 20)**

Department of Examinations

**8.** (i) දේව නීතිය හා මිනිසාගේ නීතිය අතර වෙනස්කම් විස්තර කරන්න.

| දේව නීතිය | මනුෂ්‍ය නීතිය |
|---|---|
| • සියළුම දැනුමින් පිරි අල්ලාහ් දෙවියන්ගෙන් ඇති කරන ලදී. | බැලහීනත්වයට පාත්‍ර වූ මිනිසාගෙන් ඇති කරන ලදී. |
| • නම්‍ය/ නම්‍ය නොවන ආකාරයේ නීතිය සකසා තිබීම. | සියළුම නීතීන් නම්‍යතාවයට අනුව සැකසී තිබීම. |
| • සියළුම අවස්ථාවන්වලට සහ කාලයට අනුව ගැලපෙන විධියට සකසා තිබීම. | සීමා කල කාලය සහ ප්‍රදේශයට අනුව සකසා තිබීම. |
| • අල්ලාහ්ගේ අපේක්ෂාව සහ කැමැත්ත අනුව ප්‍රමුකත්වය ලැබීම. | මිනිසාගේ කැමැත්ත අකමැත්ත අනුව සකසා තිබීම. |
| • මෙලොව සහ පරලොව ජයග්‍රහණය ඉලක්ක කොට ඇත. | මෙලොව පමණක් සඳහන් වීම |
| • සම්පූර්ණත්වය සහ ගැලපීම හේතු කොට ඇත. | විටින් විට වෙනස් කම් සහ සංශෝධනයට ලක්වීමේ හැකියාව. |
| • නීතිය කඩකිරීමෙහි මෙලොව සහ පරලොව දඬුවම් නියමිතය. | නීතිය කඩකිරීමෙන් මෙලොව දඬුවම් පමණි. |
| • අක්ලියියා සහ නක්ලිය්යා සම්බන්ධ වීම. | අක්ලියාවට පමණක් සීමා වීම. |

**(ලකුණු 10)**

(ii) පවුල් නිර්මාණයේ දී පුරුෂ හා ස්ත්‍රිය යන දෙදෙනාගේ අයිතිවාසිකම් හා යුතුකම් ගැන පැහැදිලි කරන්න.

- ගැහැනු පිරිමි භෞතික මනෝ විද්‍යා තත්වයට සහ කුසලතාවයට අනුව වගකීම් සහ අයිතීන් සීමා කිරීම
- එක් එක්කෙනෙක් වගකිවයුත්තන්ය. ඒ ඒ අයගේ වගකීම් පිළිබඳව පරලොවේදී විමසීමට ලක් විය යුතුය.
- සැකසීමට අනුව පවුල් සම්පාදනය එහි යහපත් ආරක්ෂා කරන්නටද දෙපිරිසගෙ අයිතීන් ආරක්ෂා කිරීමටද ඉස්ලාම් මග පෙන්වා ඇත.

Department of Examinations

<u>වගකීම්</u>

| ගැහැනු | පිරිමි |
|---|---|
| • අවනත වීම/ බැදී සිටීම/වගකීම | මහර් දීම |
| • භාරකාරත්වය | වියදම් බාර ගැනීම |
| • ස්වාමි පුරුෂයාගේ අවශ්‍යතාවයන් අයිතීන් ඉටුකිරීම. | බිරිදගේ අවශ්‍යතාවයන් අයිතීන් ලබාදීම. |
| • දුවා දරුවන් පාලනය කිරීම. | දුවා දරුවන්ගේ වියදම් භාර ගැනීම. |
| • පවුලේ සුරක්ෂිතතබාවය. | පවුල් නායකත්වය. |
| • ආදරයෙන් සිටීම. | ආදරයෙන් සිටීම. |
| • අපක්ෂපාතීව ජීවත් වීම. | අපක්ෂපාතීව ජීවත් වීම. |

<u>අයිතීන්</u>

- ස්වාමි පුරුෂයා සහ බිරිඳ තම තමන්ගේ වගකීම් හරියාකාරව ඉටුකිරීම තුළින් දෙදෙනාගේ අයිතීන් ආරක්ෂා කිරීමට මගයි.
- ස්වාමි පුරුෂයාගේ වගකීම් බිරිදගේ අයිතීන් ආරක්ෂා කිරීමට වගබලයි.
- බිරින්දගේ වගකීම් ස්වාමියාගේ අයිතීන් වේ.

**(ලකුණු 10)**
**(මුළු ලකුණු 20)**

Department of Examinations